**වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව - 2021**
**-------------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**
**--------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (අ) | දේශිය ණය සංවර්ධන අරමුදලට 2022 වර්ෂයේදි ගෙවිය යුතු ණය වාරිකය රු. 3,120,286 ක් ජංගම වගකීම් වශයෙන් දැක්විය යුතුවූවද, ණය ප්‍රාග්ධන යටතේ දැක්වීමෙන් මුල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් අඩුවෙන්ද ණය ප්‍රාග්ධනය වැඩියෙන්ද දක්වා තිබුණු. | දේශිය ණය සංවර්ධන අරමුදලෙන් දීර්ඝ කාලින වශයෙන් LLDF Loan ලබා තිබීමෙන් 2012 වර්ෂය සිට ණය ප්‍රාග්ධනය වශයෙන් මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. දීර්ඝකාලින ණය 2022 වර්ෂයෙන් නිමවේ. | ගිණුම්කරන ප්‍රතිපත්ති අනුව අදාල කාල පරිච්ඡේදයේ හෙළිදරව් කිරීම් සනාථ කිරීමතුලින් වටිනාකම ජංගම වගකීමක් වශයෙන් දැක්වීමට ඉදිරියේදි කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක නොකර ගෙවීම් වවුචර් පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණු නිසා වර්ෂයේ වියදම සහ ජංගම වගකීම් රු. 12,905,758 ක අගයකින් මුල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | අදාල ව්‍යාපෘති 14 කින් දැනට ව්‍යාපෘත 12 ක් නිම කර විවිධ ණය හිමියන් යටතේ ගෙවීම් සිදුකර ඇත. ඉතිරි ව්‍යාපෘති කඩිනමින් නිම කර විවිධ ණය හිමි ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර ගිණුම්ගත කළ යුතු අතර අදාල වැරදි නිවැරදි කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි 08 ක වටිනාකම. | 4,182,645 | අයිතිය සනාථ කිරීමේ සාක්ෂි | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ලියවිලි ලබා ගැනීමට කටයුතු කරන අතර, ලද විගස විගණනයට ඉදිරිපත් කරමි. | අයිතිය සනාථ කර ගැනීමේ ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වරිපනම් ආරම්භක ශේෂය | 21,479,200 | කාල විශ්ලේෂනය | වරිපනම් බදු පරිගණක ගත කර තිබීමෙන් හිඟ මුදල් සම්බන්ධ කාල විශ්ලේෂනයක් ලබා ගැනීමට නොහැක. වරිපනම් මෘදුකාංග සැපයූ ආයතනය සමග සම්බන්ධවී උපදෙස් ලබාගෙන හිග මුදල්වල කාල විශ්ලේෂනය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | අදාල නීති ප්‍රතිපාදනය අනුව කටයුතු කිරීම් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.133,517,598 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.128,265,221 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම්**<br>1987 හි අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස ගොඩනැගිලිවලින් අයකළ යුතු රු. 24,611,277 ක් වටිනා හිඟ වරිපනම් බදු අයකර ගැනීමට වසර 02 කට වඩා වැඩි කාලයක් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා බේරුම් නිලධාරින් 06 දෙනෙකු පත් කර හිඟ මුදල අයකිරීමට කටයුතු කර ඇත. ජංගම සේවය මගින් ද අය කිරීම් සිදු කරනු ලැබේ. පළමුවන කාර්තුවේ හිග මුදලින් රු. 6,688,349 ක් අයකර ගෙන ඇත. ඉතිරි හිඟ මුදල් අය කිරීමට කටයුතු කරනු ලැබේ. | අදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල තැන්පත්කර තිබූ රු. 275,201,655 ක් මුදල යොදවා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර පොළී අදායම් උපයා ගැනීම සඳහා බැංකුවේ තැන්පත් කර ඇත. | ස්ථාවර තැන්පත් මුදල් යොදවා මරුදනාර්මඩම් වෙළඳ සංකීර්ණයේ උඩ මහළ ඉදිකිරීම සඳහා (රු. මිලියන 100 ක) ටෙන්ඩර් කැඳවා 03/2020 චක්‍රලේකන අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇයදුම්පත් ප්‍රතික්ෂේප කර ඇත. නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර සංවර්ධන වැඩ නිමකිරීමට කටයුතු කරමින් පවති. | සභා අරමුදල අරපිරිමැස්මෙන් සහ උපරිම මට්ටමින් සංවර්ධන කටයුතුවල යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පරුත්තික්කලට්ටි මාර්ගයේ ඉතිරි වැඩ ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2021 සැප්තැම්බර් 23 දින වැඩ ආරම්භ කර 2021 නොවැම්බර් 21 දින නිම කළ යුතුව තිබුණි. එහෙත් අධික වර්ෂාව හේතුවක් ලෙස දක්වා 2021 දෙසැම්බර් 30 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දෛනික වර්ෂා පතන වාර්තාව අනුව අදාල කාලයේ දින 03ක් පමණක් වර්ෂාව සටහන් වී ඇත.<br>මේ හේතුවෙන්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ උපලේඛන 05 කොන්දේසි 6.4 අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 148,140 ක් කොන්ත්‍රාත් කරුගෙන් අයකර ගත යුතුය. | පරුත්තික්කලට්ටි මාර්ගයේ ඉතිරි වැඩවලට අදාල බිම පහත් බිම් ප්‍රදේශයකි. එම අවස්ථාවේ වර්ෂාව නිසා අමුද්‍රව්‍ය ලබා ගන්නා ස්ථානවල ජලය රැඳී තිබීම නිසා අමුද්‍රව්‍ය අවශ්‍යතාවය තක්සේරුකිරීම සහ ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකිව ඇත. එහෙයින් කාලය දීර්ඝ කර ඇත. තවද, ඉදිරියේදි ප්‍රමාදවන කාලය සඳහා හානි පූර්ණ අයකිරීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත් කටයුතු නියමිත කාල වකවානු තුළ ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |